ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකः 2477424, 2477423, 2477311
ෆැක්ස්ः 2346257, 2477739
ඊ-මේල්ः dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියः www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව |
| දිනය | 2012 ජූනි 26 |

## Standard and Poor's ආයතනය විසින් බැංකු කර්මාන්තය පිළිබඳ රටේ අවදානම් තක්සේරුව සම්බන්ධයෙන් මෑතකදී සිදු කරන ලද පැහැදිලි කිරීම පිළිබඳව සේවක අර්ථසාධක අරමුදල සිය ප්‍රසාදය පළ කරයි

ශ්‍රී ලංකාවෙහි බැංකු කොටස්වල විශාල වශයෙන් ආයෝජනය කර ඇති ආයතනය වන සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාලනය කිරීම හේතුවෙන් "මත පිළිබඳ වූ ගැටුමක් ඇති වීමේ හැකියාවක්" පිළිබඳ "විශේෂිත සිදුවීම් සිදුවන බවට කිසිදු තොරතුරක් ලැබී නොමැති බව" Standard and Poor's ආයතනය විසින් අද දින කරනු ලැබ ඇති පැහැදිලි කිරීම පිළිබඳව සේ.අ.අ. සිය ප්‍රසාදය පළ කරයි.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුව "මෙසේ ඇති විය හැකි අවදානම් සීමා කර ගැනීම සඳහා අවශ්‍යකරන යාන්ත්‍රණයන් පවත්වා ගනු ඇතැයි බලාපොරොත්තු වන බව ද" Standard and Poor's ආයතනයේ පැහැදිලි කිරීමේ දැක්වේ. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නැවතත් සහතික කර සිටිනුයේ එසේ සඳහන් කරන ලද ඕනෑම අවදානමක් සීමා කිරීම සඳහා අවශ්‍ය වන යාන්ත්‍රණයන් මහ බැංකුව සතුව පවතින බවත්, විශේෂයෙන්ම මෙම අරමුණු සඳහාම පිහිටුවා ගනු ලැබ ඇති ආරක්ෂක විධි විධාන සහිතව, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ මහ බැංකුවෙහි අනෙකුත් දෙපාර්තමේන්තු වල කටයුතු වලින් ස්වෛරීව සේ.අ.අ. හි කටයුතු පවත්වාගෙන යනු ලබන බවත්ය. 1949 හි අංක 58 දරණ මුදල් නීති පනතෙහි 45 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සෑම නිලධාරියෙකුම සහ සේවකයෙකුම තමා විසින් රාජකාරී මට්ටමින් ඉටු කරනු ලබන සෑම කටයුත්තක් සම්බන්ධයෙන්ම රහස්‍යභාවය සුරැකීමට හා එය සුරැකීමට අනුබල දීමට නීත්‍යානුකූලව බැඳී සිටින බැවින් මෙකී ආරක්ෂක විධි විධාන ආරම්භයේ පටන්ම ක්‍රියාත්මකව පැවතුනි. ඒ අනුව, සිය ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි දී සේ.අ.අ. ට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වෙනයම් දෙපාර්තමේන්තුවකින් ලබා ගත හැකි අභ්‍යන්තර තොරතුරු ලබා ගැනීමේ වාසි සහගත තත්ත්වයන් උදාකර

ගැනීමට අවස්ථාවක් නොමැති අතර, මහජනතාවට පොදුවේ ලබාගත හැකි තොරතුරු හා පර්යේෂණ පමණක් භාවිතා කිරීමට ඉඩකඩ සැලසේ.

එබැවින්, ආයෝජන ක්‍රියාවලිය මගින් මත පිළිබඳ ගැටුමක් හෝ අයුතු භාවිතයක් කිසිදු ආකාරයකින් ඇති නොවන බව ද සේ.අ.අ. අවධාරණය කර සිටියි.

තවද, සේ.අ.අ. පනතෙහි 5 (1) (ඉ) වගන්තිය මගින් අරමුදලෙහි මුදල් සුදුසු යැයි හැඟෙන සුරැකුම් පත් හි ආයෝජනය කිරීමට ද, එකී සුරැකුම්පත් විකිණීමට ද මුදල් මණ්ඩලයට බලය පවරා ඇත. එබැවින්, බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රය ද ඇතුළුව කොටස් වෙළෙඳ පොළෙහි ආයෝජනයන් සිදු කිරීමට සේ.අ.අ. ට පූර්ණ බලතල පවතී. එසේම, රටෙහි විශාලතම අරමුදල වන සේ.අ.අ. කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි ඉහළම කාර්ය සාධනයක් පෙන්වනු ලබන බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයෙහි ආයෝජනය කිරීමෙන් වැළකී සිටිය හොත් එය එහි සාමාජිකයන්ට කරනු ලබන අසාධාරණයක් බව ද සේ.අ.අ. තවදුරටත් ප්‍රකාශ කර සිටියි.